ලාභාලාභ ප්‍රකාශය	2024 රු. 000	2023 රු. 000
ආදායම්	**7,582,723**	**7,478,049**
පොලී සහ සමාන ආදායම්	6,207,886	6,559,123
පොලී සහ සමාන වියදම්	(4,021,096)	(4,918,658)
ශුද්ධ පොලී ආදායම්	**2,186,790**	**1,640,465**
ගාස්තු සහ කොමිස් ආදායම්	211,880	123,292
ගාස්තු සහ කොමස් වියදම්	(43,332)	(16,757)
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම්	**168,548**	**106,535**
ශුද්ධ වෙළඳ ආදායම	793,811	120,243
ලාභ අලාභ මඟින් සාධාරණ අගයට නම්කල මූල්‍ය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	257,327	559,224
වෙනත් මෙහෙයුම් ආදායම්	111,819	116,167
මුළු මෙහෙයුම් ආදායම	**3,518,295**	**2,542,634**
ණය සහ අනිකුත් වත්කම් හානිකරණය සඳහා (වෙන්කිරීම්)/ආපසු හැරවීමේ දීමනාව	101,111	25,094
ශුද්ධ මෙහෙයුම් ආදායම	**3,619,406**	**2,567,728**
සේවක මණ්ඩල පිරිවැය	(1,400,614)	(1,289,690)
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය	(291,078)	(272,869)
අනෙකුත් මෙහෙයුම් වියදම්	(1,084,583)	(739,416)
මුළු මෙහෙයුම් වියදම්	**(2,776,275)**	**(2,301,975)**
මූල්‍ය සේවා මත එ.අ. මත බඳු සහ සමූහයේ සමාගම් වල ආයෝජන හානිකරණයට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)	**843,131**	**265,753**
පරිපාලිත සමාගමේ ආයෝජන හානිකරණය	(4,435)	95,065
සමූහයේ සමාගම් වල ආයෝජන හානිකරණයට පසු මෙහෙයුම් ලාභය/(අලාභය)	**838,696**	**360,818**
මූල්‍ය සේවා සඳහා එකතු කල අගය මත බදු	(392,787)	(292,911)
ආදායම් බදු වලට පෙර ලාභය/(අලාභය)	**445,909**	**67,907**
ආදායම් බදු (වියදම්)/ආපසු හැරවීම	(205,455)	(47,019)
වර්ෂයට අදාළ ලාභය/(අලාභය)	**240,454**	**20,888**
කොටසක ඉපැයීම		
කොටසක මූලික/තනුක (අලාභ)/ඉපැයුම (රු)	0.46	0.04

විස්තීර්ණ ආදායදම් ප්‍රකාශය	2024 රු. 000	2023 රු. 000
වර්ෂයට අදාළ ලාභය/(අලාභය)	**240,454**	**20,888**
අනෙකුත් විස්තිරණ ආදායම්/(වියදම්)		
ඉදිරි කාලසීමාවන්හි ලාභඅලාභ වලට නැවත වර්ග කරනු ලබන අනෙකුත් විස්තිරණ ආදායම්/(වියදම්) (බදු වලට ශුද්ධ)		
සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් මත ප්‍රත්‍යාගණන ලාභය/(අලාභය)	2,750	(1,515)
ඉදිරි කාල සීමාවන්හි ලාභ අලාභ වලට නැවත වර්ග කරනු ලබන අනෙකුත් ශුද්ධ විස්තීරණ ආදායම්/(වියදම්)	**2,750**	**(1,515)**
ඉදිරි කාල සීමාවන්හි ලාභ අලාභ වලට නැවත වර්ග නොකරනු ලබන අනෙකුත් විස්තීරණ ආදායම්/(වියදම්) (බදු වලට ශුද්ධ)		
නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් මත ජීව ගණන ලාභ/(අලාභ)	(45,492)	(63,207)
අනෙකුත් විස්තීරණ ආදායම් සංරචක වලට අදාල විලම්භිත බදු	13,648	18,962
ඉදිරි කාල සීමාවන්හි ලාභ අලාභ වලට නැවත වර්ග නොකරනු ලබන අනෙකුත් ශුද්ධ විස්තීරණ ආදායම්/(වියදම්)	**(31,844)**	**(44,245)**
වර්ෂය සඳහා වන වෙනත් විස්තීරණ ආදායම්/(වියදම්), බදු ගෙවු පසු	(29,094)	(45,760)
වර්ෂය සඳහා වන මුළු විස්තීරණ ආදායම්/(වියදම්), බදු ගෙවු පසු	**211,360**	**(24,872)**

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය	2024 රු. 000	2023 රු. 000
වත්කම්		
මුදල් සහ මුදල් සමාන දෑ	752,190	720,397
බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතු	203,332	574,588
ලාභ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්	8,534,914	8,161,368
ණය සහ අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ	25,942,008	19,054,715
අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම්	16,554	14,348
මූල්‍ය ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය යටතේ	3,473,969	3,727,940
දේපල වෙළඳාම් තොගය	40,446	58,158
ආශ්‍රිතයන් හි ආයෝජන	81,084	81,084
පරිපාලිතයන් හි ආයෝජන	348,261	352,696
දේපල ආයෝජන	-	95,446
දේපල උපකරණ හා භාවිතයට ආයිතිය ඇති වත්කම්	467,355	585,436
අස්පෘශ්‍ය වත්කම්	61,329	67,117
විලම්භිත බදු වත්කම්	91,893	54,951
වෙනත් වත්කම්	186,673	150,878
මුළු වත්කම්	**40,200,008**	**33,699,122**
වගකීම්		
බැංකුවලට ගෙවිය යුතු	8,144,088	2,599,970
ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු ක්‍රමක්ෂය පිරිවැය යටතේ	25,956,175	25,444,119
නිකුත් කල ණය හා අනෙකුත් ණය ගැනීම් ක්‍රමක්ෂය පිරිවැය යටතේ	730,033	741,030
වර්තමාන බදු වගකීම්	209,437	30,055
අනෙකුත් වගකීම්	895,070	858,908
විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම්	383,174	354,368
මුළු වගකීම්	**36,317,977**	**30,028,450**
හිමිකම්		
ප්‍රකාශිත ප්‍රාග්ධන	4,276,448	4,276,448
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	392,265	344,174
රඳවා ගත් ඉපැයුම්	(1,189,204)	(1,289,648)
RLA සංචිත	424,622	371,590
OCI සංචිත	(22,100)	(31,892)
මුළු හිමිකම්	**3,882,031**	**3,670,672**
මුළු වගකීම් සහ හිමිකම්	**40,200,008**	**33,699,122**
අසම්භාව්‍ය වගකීම් සහ බැදීම්	48,858	42,093
කොටසකට ශුද්ධ වත්කම් අගය (රු.)	7.40	7.00

තෝරාගත් කාර්ය සාධක දර්ශක	2024/12/31 දිනට (විගණනය නොකළ)	2023/12/31 දිනට (විගණනය නොකළ)
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව		
මූලික ප්‍රාග්ධනය (පළමු පෙළ ප්‍රාග්ධනය), රු.000	3,079,961	2,950,935
මුළු ප්‍රාග්ධනය, රු.000	3,719,619	3,634,681
අවදානම මත බර තැබූ වත්කම් මත මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය% (අවම අවශ්‍යතාව, 8.5%)	11.97%	13.60%
අවදානම මත බර තැබූ සමස්ථ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය% (අවම අවශ්‍යතාව, 12.5%)	14.45%	16.75%
ප්‍රාග්ධන අරමුදලට තැන්පත් වගකීම් අනුපාතය (අවම අවශ්‍යතාවය, 10%)	15.87%	15.75%
වත්කම්වල ගුණත්වය (ණය කළඹේ තත්වය)		
දළ අක්‍රීය ණය, රු.000	3,990,711	4,579,316
දළ අක්‍රීය ණය අනුපාතය %	14.07%	21.06%
ශුද්ධ අක්‍රීය ණය අනුපාතය %	4.08%	7.12%
ලාභදායිත්වය (%)		
පොලී ආන්තිකය	6.52%	5.55%
වත්කම් මත ප්‍රතිලාභය (බදු පෙර)	1.21%	0.21%
හිමිකම් මත ප්‍රතිලාභය (බදු පසු)	6.37%	0.57%
නියාමන ද්‍රවශීලතාවය (රු. 000)		
අවශ්‍ය අවම ද්‍රවශිල වත්කම් ප්‍රමාණය	3,172,545	2,859,509
පවත්නා ද්‍රවශිල වත්කම් ප්‍රමාණය	9,697,514	3,257,794
අවශ්‍ය අවම රජයේ සුරැකුම්පත් ප්‍රමාණය	1,945,408	2,086,865
පවත්නා රජයේ සුරැකුම්පත් ප්‍රමාණය	2,991,310	2,979,348
නාමික තොරතුරු		
සේවක සංඛ්‍යාව	870	785
ශාඛා සංඛ්‍යාව	47	48

සහතික කිරීම

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හී ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් පහත අත්සන් තබන අපි:

(අ) ඉහත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරන ලද ආකෘතීන් හා නිර්වචන වලට අනුව පිළියෙල කර ඇති බවත්,

(ආ) මෙම ප්‍රකාශයෙන් හි අඩංගු තොරතුරු උපුටාගෙන ඇත්තේ ලියාපදිංචි කල මූල්‍ය සමාගමේ විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලිනි. නො එසේ නම් ''විගණනය නොකළ'' බව සඳහන් කර ඇත.

(අත්සන් කළේ)	(අත්සන් කළේ)	(අත්සන් කළේ)
චරිත විතාන	**එච් කේ ඩී ඩබ්ලිව් එම් ඩී කේ හපුහින්න**	**ඩී එම් එස් පී බණ්ඩාර**
ප්‍රධාන මූල්‍ය නිලධාරී	ප්‍රධාන විධායක නිලධාරී	අනුකූලතා නිලධාරී
26 මාර්තු 2025	**26 මාර්තු 2025**	**26 මාර්තු 2025**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/H/BOC-S/MBSL/FA/2024 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 27 March 2025

සභාපති
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී.

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සහ එහි පරිපාලිතයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සි ("සමාගම") සහ සමාගමේ සහ එහි පරිපාලිතයේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කරුණු

ප්‍රධාන විගණන කරුණු නම්, මාගේ වෘත්තීය විනිශ්චය අනුව, වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයේ දී වඩාත් වැදගත් වූ කරුණු වේ. සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන රාමුව තුළ එම කරුණු ආමන්ත්‍රණය කරන ලද අතර, ඒ පිළිබඳව මාගේ මතය සැකසීමේදී, මෙම කරුණු පිළිබඳව වෙනම මතයක් ඉදිරිපත් නොකරමි.පහත සෑම කරුණක් සඳහාම, මාගේ විගණනය විසින් මෙම කාරණය ආමන්ත්‍රණය කළ ආකාරය පිළිබඳ මාගේ විස්තරය එම රාමුව තුළ සපයා ඇත.

මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන අංශයේ විගණනය සඳහා විගණකවරයාගේ වගකීම් විස්තර කර ඇති අතර එම වගකීම්, මෙම කරුණුවලට අදාළව මම ඉටු කර ඇත්තෙමි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ අවදානම පිළිබඳ මාගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රියා පටිපාටිවල කාර්ය සාධනය මාගේ විගණනයට ඇතුළත් විය. මාගේ විගණන ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල, පහත සඳහන් කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියා පටිපාටි ඇතුළුව, මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ මාගේ විගණන මතය සඳහා පදනම සපයයි.

ප්‍රධාන විගණන කාරණය	මාගේ විගණනය ප්‍රධාන විගණන කාරණය ආමන්ත්‍රණය කළ ආකාරය
ණය සහ අත්තිකාරම් වල අපේක්ෂිත ණය පාඩු ක්‍රමක්ෂය කළ පිරිවැයට අනුව මනිනු ලබයි. සටහන 23 හි දක්වා ඇති පරිදි ණය සහ අත්තිකාරම් වල අපේක්ෂිත ණය පාඩු ක්‍රමක්ෂය කළ පිරිවැයට අනුව මැනීම මූල්‍ය ප්‍රකාශනවල සටහන 3.5.11 හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත පදනම්ව කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ. **මෙය ප්‍රධාන විගණන කාරණයක් විමට හේතු වන්නේ** • එවැනි ණය සහ අත්තිකාරම් ආපසු අයකර ගැනීම සඳහා අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීම හා සම්බන්ධ සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයන්, උපකල්පන සහ අවිනිශ්චිතතා මට්ටම සම්බන්ධ වීම; සහ • වාර්තා වී ඇති අපේක්ෂිත ණය පාඩු ප්‍රමාණයේ ප්‍රමාණාත්මකභාවය ණය සහ අත්තිකාරම් සඳහා අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් සිදු කරන ලද සැලකිය යුතු විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල ප්‍රධාන ක්ෂේත්‍ර අතරට ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික අවස්ථා, ආශ්‍රිත බර තැබීම් සහ ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන සලකා බැලීම් ඇතුළත් වේ. මේවා සහජයෙන්ම ඉහළ යන ඇස්තමේන්තු අවිනිශ්චිතතා මට්ටම්වලට යටත් වේ. එවැනි ප්‍රධාන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන් පිළිබඳ තොරතුරු 3.5.11 සටහනෙහි අනාවරණය කර ඇත.	ණය සහ අත්තිකාරම් වල අපේක්ෂිත ණය පාඩුවල ප්‍රමාණවත් බව ආමන්ත්‍රණය කිරීමේදී, මාගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය: • මාගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගත හැකි හොඳම තොරතුරු මත පදනම්ව, එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට, ආර්ථික තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම ඇතුළුව පාදක ක්‍රමවේදය සමඟ සමූහයේ අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම් තක්සේරු කරන ලදී • අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම සහ අපේක්ෂිත ණය පාඩු ඇස්තමේන්තු කිරීම සඳහා පවතින පාලන ක්‍රමවල මෙහෙයුම් කාර්යක්ෂමතාව, අධීක්ෂණ මට්ටම තක්සේරු කිරීම, අපේක්ෂිත ණය පාඩු සඳහා දීමනා සමාලෝචනය සහ අනුමත කිරීම, මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ඇතුළත්, ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඇගයීමට ලක් කළෙමි. • සමූහයේ අදාළ මූලාශ්‍ර ලේඛන සහ ගිණුම් වාර්තා වල විස්තර සමග එකඟ වීමෙන්, අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමේදී භාවිතා කරන ලද පාදක දත්තවල සම්පූර්ණත්වය, නිරවද්‍යතාවය සහ සාධාරණ බව පරීක්ෂා කළෙමි. • ණය තත්ත්ව ඇගයීම් සහ අදාළ අදියර වර්ගීකරණයන්හි සාධාරණත්වය ඇගයීමට ලක් කළෙමි. • පහත ක්‍රියා පටිපාටිද සිදු කරන ලදී: • **හානිකරණ සඳහා තනි පදනමක් මත ණය සහ අත්තිකාරම් සඳහා:** • තනි හානිකරණ ගණනය කිරීම් වල අංක ගණිතමය නිරවද්‍යතාවය පරීක්ෂා කළෙමි. • ආර්ථික තත්ත්වයන් සමග අපේක්ෂිත ණය පාඩු සඳහා භාවිතා කරන ලද ප්‍රධාන යෙදවුම්වල සාධාරණ බව ඇගයීමට ලක් කළෙමි. විශේෂයෙන් ඉහළ අවදානම් කර්මාන්තවලට අදාළව මුදල් ප්‍රවාහ අනාවැකිවල වටිනාකම සහ කාලය සහ ඇපකර අයකර ගැනීමේ තත්ත්වය සැලකිල්ලට ගනිමින් එවැනි ඇගයීම් සිදු කරන ලදී. • **හානිකරණ සඳහා සාමූහික පදනමක් මත තක්සේරු කරන ලද ණය සහ අත්තිකාරම් සඳහා:** • අපේක්ෂිත ණය පාඩු සඳහා දීමනාවේදී භාවිතා කළ ප්‍රධාන යෙදවුම් සහ ගණනය කිරීම් පරීක්ෂා කළෙමි. • පාදක කරගත් ක්‍රමවේද සහ කළමනාකාරිත්ව ආවරණ වලදී කළමනාකරණය විසින් භාවිතා කරන විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු වල සාධාරණ බව තක්සේරු කළෙමි. මාගේ පරීක්ෂණයට භාවිතා කරන ලද ඉදිරි දැක්මක් සහිත තොරතුරුවල සාධාරණත්වය, සලකා බැලූ ආර්ථික තත්වයන් සහ එම එක් එක් තත්ත්ව සඳහා පවරන ලද සම්භාවිතා බර තැබීම් තක්සේරු කිරීම ඇතුළත් විය. 3.5.11, 23 සහ 48.2 සටහන්වල දක්වා ඇති අදාළ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කළෙමි.
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්ට අදාළ තොරතුරු තාක්ෂණ (තඔ) පද්ධති සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය බහු තොරතුරු තාක්ෂණ පද්ධති සහ අදාල අභ්‍යන්තර පාලනයන් මත සැලකිය යුතු ලෙස රඳා පවතී. තවද, ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම් සකස් කරනු ලබන්නේ තොරතුරු තාක්ෂණ පද්ධති මගින් ජනනය කරන ලද දත්ත සහ වාර්තා භාවිතා කරමින් වන අතර ඒවා පැතුරුම්පත් (වරඩීයැඩ්) භාවිතයෙන් සම්පාදනය කර සකස් කර ඇත. ඒ අනුව, මූල්‍ය වාර්තාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධති සම්බන්ධ අභ්‍යන්තර පාලනයන් ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකේ.	මාගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය: ■ ක්‍රියාවලිවල අභ්‍යන්තර පාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගත් අතර මූල්‍ය වාර්තාකරණය සහ අදාළ හෙළිදරව් කිරීම් සම්බන්ධ අදාළ පාලනයන් පරීක්ෂා කර ඇත. ■ අපගේ අභ්‍යන්තර විශේෂිත සම්පත් සම්බන්ධ කර ගත් අතර; ■ පරිශීලක ප්‍රවේශය සහ වෙනස් කළමණාකරණයට අදාළ ඒවා ඇතුළුව, තොරතුරු තාක්ෂණ පද්ධති ආශ්‍රිත අභ්‍යන්තර පාලනවල සැලසුම් සහ මෙහෙයුම් ඵලදායිතාව හඳුනාගෙන, ඇගයීමට ලක් කර සහ පරීක්ෂා කළෙමි. ■ සමාගමට බලපාන සයිබර් ආරක්ෂණ අවදානම් සහ මූලික වශයෙන් විමර්ශනය තුළින් මෙම අවදානම් විසඳීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඉහළ මට්ටමේ අවබෝධයක් ලබා ගත්තෙමි. ■ සාමාන්‍ය ලෙජර් සැසඳුම් සමාලෝචනය ඇතුළුව, නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය සඳහා හෙළිදරව් කිරීම් උත්පාදනය කිරීමට භාවිතා කරන වාර්තාවල මූලාශ්‍ර දත්ත පරීක්ෂා කළෙමි.

1.4 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ 2024 වාර්ෂික වාර්තාව මම කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගම සහ සමූහය විසින් ස්වකීය මුළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන ඇපවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතනවල හෝ ව්‍යාපාර සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතුය. මාගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ඇතුළුව අනෙකුත් කරුණු අතර සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින පාර්ශවයන් සමග මම සන්නිවේදනය කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම්ව ප්‍රමාණාත්මක කරුණුවලට සීමා වූ කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම හා සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
(ලංකා බැංකුවට අනුබද්ධිත ආයතනයකි)
ලංකා බැංකු මර්චන්ට් කුළුණ,
නො. 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.
දුරකථන: 0114 711 711, ෆැක්ස් : 0114 711 765, විද්‍යුත් තැපෑල : mbslbank@mbslbank.com, වෙබ් අඩවිය : www.mbslbank.com